# 49 안전화를 안 신으면 다칠 수 있어요


## ආරක්ෂිත සපත්තු පළඳින්නේ නැත්නම් තුවාල වෙන්න පුළුවන්

**학습 안내** අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

| | |
|---|---|
| ▫ අධ්‍යයන අරමුණු | අනතුරුදායක තත්වයන්ගෙන් වැළකීම, අනතුරුගැන අනතුරු හැඟවීම |
| ▫ ව්‍යාකරණ භාවිතය සඳහා උපදෙස් | –(으)ㄹ 수 있다, –기 때문에 |
| ▫ වචන භාවිතය සඳහා උපදෙස් | ආරක්ෂක උපකරණ, වැඩබිමේ සිදුවන අනතුරු |
| ▫ සංස්කෘතික තොරතුරු | ශරීර කොටස් සහ ආරක්ෂිත උපකරණ |

## 대화 1 සංවාදය 1

Track 151



පහත දැක්වෙන්නේ කළමණාකාරීතුමා සහ අදිත් මහතාගේ සංවාදයයි. කළමණාකාරීතුමා අදිත් මහතා ආරක්ෂිත උපකරණ සියල්ල පැළඳුවා දැයි පරීක්ෂා කරමින් සිටියි. ප්‍රථමයෙන්ම සංවාදයට දෙවරක් සවන් දී අනුගමනය කරන්න.

관리자 아딧 씨, 보호구 모두 착용했지요?
අදිත් මහත්මයා, ආරක්ෂක උපකරණ ඔක්කොම පැළඳගත්තා නේද?

아 딧 네, 안전모도 쓰고 안전장갑도 꼈어요.
ඔව්, ආරක්ෂිත හිස්වැසුම දාල ආරක්ෂිත අත් මේස් දාගත්තා.

관리자 좋아요. 그런데 안전모 끈은 조금 더 조이는 게 좋겠어요. 그리고 오늘은 높은 곳에서 작업해야 하니까 안전대도 꼭 착용하세요.
හොඳයි, ඒ වුනත් ආරක්ෂක හිස් වැස්මේ පටිය ටිකක් තව තදට තියෙන එක හොඳයි, ඒ වගේම අද ඉහළ ස්ථානයක වැඩ කලයුතු නිසා ආරක්ෂක පටිත් අනිවාරයෙන්ම පළඳින්න.

아 딧 네, 알겠습니다. ඔව්, තේරුණා.

관리자 어! 그런데 안전화는 왜 안 신었어요? 안전화를 안 신으면 발을 다칠 수 있어요.
ඕ, නමුත් ඇයි ආරක්ෂක සපත්තු පැළඳුවේ නැත්තේ? ආරක්ෂක සපත්තු පළඳින්නේ නැත්නම් කකුල තුවාල වෙන්න පුළුවන්.

아 딧 어! 깜빡했네요. 바로 갈아 신을게요.
ඕ, අමතක වුණානේ, ඉක්මනින් මාරු කරලා දාගන්නම්.

> **깜빡하다** එක් වර අමතක වුවා
> මතකය නැති වීම හෝ එක්වර සිහියට නොපැමිණීම
> · 보호구를 챙기는 것을 깜빡했어요.
> ආරක්ෂක උපකරණ පැළඳීමට අමතක වුවා.

> **갈아 신다** මාරුකර පැළඳීම
> වෙනත් පාවහන් යුගලයක් මාරු කර පැළඳීමයි. ඇඳුමක් මාරු කර පැළඳීම 갈아입다 ගමන් කිරීමේ ක්‍රමය මාරු කිරීමේදී 갈아타다 යන්න භාවිතා කරයි.
> · 산책할 때는 편한 신발로 갈아 신으세요.
> ඔබ ඇවිදින විට, සැහැල්ලු සපත්තු වලට මාරු කර පළඳින්න.



හොඳින් සවන්දී අනුගමනය කලාද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 아딧 씨는 무슨 보호구를 착용해야 해요? අදිත් කිනම් ආරක්ෂිත උපකරණ පැළඳිය යුතුද?
2. 아딧 씨는 왜 안전화를 안 신었어요? අදිත් ඇයි ආරක්ෂිත සපත්තු පැළඳුවේ නැත්තේ?

정답 1. 안전모, 안전장갑, 안전대를 착용해야 해요. 2. 안전화를 신는 것을 깜빡했어요.



## 어휘 1 වචන මාලාව 1 — 보호구 ආරක්ෂිත උපකරණ




ආරක්ෂිත උපකරණ කිනම් දෑ තිබේද? ආරක්ෂිත උපකරණ වර්ග පිළිබඳ දැන ගනිමුද?




착용하다
පළඳිනවා



보호복
ආරක්ෂිත ඇඳුම







안전모
ආරක්ෂිත හිස්වැසුම



보안면
ආරක්ෂිත මුහුණු ආවරණය



용접면
වෙල්ඩින් මුහුණු ආවරණය



보안경
ආරක්ෂිත ඇස් කණ්නාඩි



마스크
මුඛ ආවරණය




귀마개
කන් ආවරණ ඇබය




귀덮개
ආරක්ෂිත කන් ආවරණය



안전대
ආරක්ෂිත පටිය



목장갑
රෙදි අත් ආවරණය




안전장갑
ආරක්ෂිත රබර් අත් ආවරණය



안전화
ආරක්ෂිත සපත්තු



안전장화
ආරක්ෂිත බූට් සපත්තු



ඉහත සදහන් වචන මාලාව දෙස නොබලා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න උත්සහ කරන්න.

1. 사진을 보고 알맞은 말을 연결하세요. පින්තූර බලා නිවැරදි වචනය සමග යා කරන්න.

①  ②  ③  ④  ⑤ 

㉠ 귀마개 ㉡ 보호복 ㉢ 마스크 ㉣ 안전장화 ㉤ 목장갑

정답 ① ㉡ ② ㉠ ③ ㉢ ④ ㉤ ⑤ ㉣

## 문법 1 සංවාදය 1 -(으)ㄹ 수 있다 G49-1

ක්‍රියා පදයකට සම්බන්ධ කර යම්කිසි ක්‍රියාවක් සිදුවීමට ඇති හැකියාව මින් අදහස් කෙරේ. අනෙක් පසට දැනුම පිළිබඳ විමසීමේදී ද යොදාගත හැක.

| 자음 (ව්‍යඤ්ජන) → **-을 수 있다** | 모음 (ස්වර), 자음 'ㄹ' (ව්‍යඤ්ජනය -ㄹ) → **-ㄹ 수 있다** |
|---|---|
| 늦다 → 늦**을 수 있다**<br>입다 → 입**을 수 있다** | 다치다 → 다**칠 수 있다**<br>만들다 → 만**들 수 있다** |

- 가: 택시를 타고 갈까요? ටැක්සි එකක නැගලා යමුද?
  나: 지금 차가 막히는 시간이라서 택시를 타면 더 **늦을 수 있어요.**
  දැන් වාහන තදබද වෙලාව නිසා ටැක්සි එකක නැගලා ගියොත් තව ප්‍රමාද වෙන්න පුළුවන්.
- 가: 보안경을 안 쓰면 눈을 **다칠 수 있어요.**
  ආරක්ෂක උපැස් යුවලක් පාවිච්චි නොකළහොත් ඇස් තුවාල වෙන්න පුළුවන්.
  나: 네, 알겠습니다. 꼭 쓸게요. ඔව්. තේරුණා. අනිවාර්යයෙන්ම පාවිච්චි කරන්නම්.
- 가: 용접면을 꼭 써야 돼요? පෑස්සුම් මුහුණක් අනිවාර්යයෙන්ම පාවිච්චි කරන්න ඕනෙද?
  나: 그럼요. 얼굴에 화상을 **입을 수 있어요.** ඔව්. මුහුණ පිළිස්සෙන්න පුළුවන්.

### 대조적 정보 වෙනත් තොරතුරු

යම් කාර්යයක් කිරීමට ඇති හැකියාව ප්‍රකාශ කිරීමේදී සිංහල භාෂාවෙන් 'ටයික්වොන්ඩො පුළුවන්.' යන්නෙහි 'පුළුවන්' යන්න යොදාගෙන 'හැකියාව ඇත'යි අර්ථ ගන්වන නමුත් කොරියානු භාෂාවෙහි 'හැකියාව ඇත' යන්න පැහැදිලි කිරීමට '-(으)ㄹ 수 있다/없다' වාක්‍ය රටාව යොදාගනු ලැබේ.

- 그릇이 **뜨거울 수 있으니까** 조심하세요. භාජනය උණුසුම් විය හැකි නිසා ප්‍රවේසම් වන්න,




'-(으)ㄹ 수 있다' ව්‍යාකරණය ගැන අවබෝධ වුණා නේද? එසේනම් පින්තූරය බලා සංවාදය සම්පූර්ණ කරන්න.

2. 사진을 보고 '-(으)ㄹ 수 있다'를 사용해서 대화를 완성하세요.
ඡායාරූපය බල'-(으)ㄹ 수 있다' භාවිතා කර සංවාදය සම්පූර්ණ කරන්න.

1) 
귀를 다치다

가: 귀마개를 꼭 해야 해요?
ආරක්ෂිත කන් ආවරණ ඇබය අනිවාර්යයෙන්ම පැළඳිය යුතුද?
나: 네, 귀마개를 안 하면 ________________.
ඔව්, කන් ආවරණ ඇබය පැළඳුවේ නැතිනම් (කනට හානි වීමට ඉඩ ඇත).

2) 
손을 다치다

가: 안전장갑을 꼭 해야 해요? ආරක්ෂිත රබර් අත්මේස් අනිවාරයෙන්ම පැළඳිය යුතුද?
나: 네, 안전장갑을 안 끼면 ________________.
ඔව්, ආරක්ෂිත රබර් අත්මේස් පැළඳුවේ නැතිනම් (අතට හානි වීමට ඉඩ ඇත).

3) 
발을 다치다

가: 안전화를 꼭 신어야 해요? ආරක්ෂිත සපත්තු අනිවාරයෙන්ම පැළඳිය යුතුද?
나: 네, 안전화를 안 신으면 ________________.
ඔව්, ආරක්ෂිත සපත්තු පැළඳුවේ නැතිනම් (කකුලට හානි වීමට ඉඩ ඇත).

정답 1) 귀를 다칠 수 있어요 2) 손을 다칠 수 있어요 3) 발을 다칠 수 있어요

## 대화 2 සංවාදය 2

Track 152

ජිහුන් මහතා තුආන් මහතාට අනතුරු විය හැකි සිද්ධීන් පිළිබඳ පවසමින් සිටියි. පුද්ගලයින් දෙදෙනා මොනවගේ දෑ කතා කරමින් සිටිද? සංවාදයට දෙවරක් සවන් දෙන්න.

지 훈 어! 투안 씨, 장갑을 끼고 밀링 작업을 하면 안 돼요.
ඕ, තුආන් මහත්මයා, අත් මේස් දාගෙන ඇලි කැපීමේ වැඩ කරන්න එපා.

투 안 네? 공장장님이 작업을 할 때는 항상 장갑을 끼라고 하셨는데요.
ඔව්, මැනේජර් මහත්මයා වැඩ කරන විට නිතරම අත් මේස් පළඳින්න කියලනේ කිව්වේ.

지 훈 그렇지만 밀링 작업을 할 때는 장갑이 기계에 감길 수 있기 때문에 맨손으로 해야 돼요.
එහෙම වුනත් ඇලි කැපීමේ වැඩ කරන විට අත්මේස් යන්ත්‍රයේ එතෙන්න පුළුවන් නිසා හිස් අතින් කල යුතුයි,

투 안 아, 그러네요. 얼른 뺄게요.
ආ, එහෙමද. ඉක්මනින් ගලවන්නම්.

지 훈 그리고 작업하는 동안 파편이 튈 수 있으니까 보안경도 잊지 말고요.
ඒ වගේම වැඩ කරන කාලය තුළ කුඩා කැබලි විසිවෙන්න පුළුවන් නිසා ආරක්ෂිත ඇස් ආවරණය පළඳින්නත් අමතක කරන්න එපා.

투 안 알겠어요, 지훈 씨.
තේරුණා, ජිහුන් මහත්මයා.

> **얼른** ඇන්මම
> වේලාවක් ගත් නොවී එම වේලාවෙම
> · 얼른 일어나서 출근 준비를 하세요.
> ඇන්ම, නැගිටලා වැඩට යන්න සූදානම් වෙන්න.
> · 사장님이 들어오시자 직원들은 얼른 자리에서 일어났다.
> ප්‍රධානීතුමා පැමිණි විට කාර්ය මණ්ඩලය ඉක්මණින් නැගිටුණා.

> **맨손** කිසිවක් නොපැළඳි අත
> කිසිවක් නොපැළඳි අත යන්න අදහස් වේ
> · 가: 어머, 화상을 입었어요?
> අයියෝ, අත පිච්චුණාද?
> 나: 네, 맨손으로 뜨거운 냄비를 잡아서요.
> ඔව්, නිකන් අතින් රස්නේ භාජනයක් ඇල්ලුව නිසයි.

මෙවර ජිහුන් මහතා සහ තුආන් මහතා ලෙස සංවාදය අනුගමනය කරන්න. හොඳින් සවන් දී අනුගමනය කළාද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 지훈 씨는 투안 씨에게 무엇을 하면 안 된다고 했어요?
ජිහුන් මහතා තුආන් මහතාට කුමක් ද නොකල යුතුදැයි පැවසුවේ?





2. 밀링 작업을 할 때는 왜 맨손으로 해야 해요?
කපන වැඩ කරද්දී ඇයි නිකන් අතින් කල යුත්තේ?

정답 1. 장갑을 끼고 밀링 작업을 하면 안 된다고 했어요. 2. 장갑이 기계에 감길 수 있어서 위험해요.

# 어휘 2 වචන මාලාව 2 작업장 사고 වැඩබිමේදී සිදුවන අනතුරු




රැකියා ස්ථානයේදී සිදුවිය හැකි අනතුරු මොනවාද? අනතුරු සම්බන්ධයෙන් වන වචන මොනවාදැයි දැන ගනිමුද?

| | | | |
|---|---|---|---|
|  |  |  |  |
| 부딪히다/충돌하다<br>එකිනෙකා ගැටෙනවා | 넘어지다<br>ඇද වැටෙනවා | 미끄러지다<br>ලිස්සනවා | 떨어지다/추락하다<br>ඉහළ සිට ඇද වැටෙනවා |
|  |  |  |  |
| 구덩이에 빠지다<br>වලකට වැටෙනවා | 파편이 튀다<br>කැබලි විසි වෙනවා | 맞다<br>වදිනවා/ගැටෙනවා | 기계에 감기다<br>යන්ත්‍රයට අහුවෙනවා |
|  |  |  |  |
| 감전되다<br>විදුලි සැර වදිනවා | 가스가 새다/<br>누출되다<br>ගෑස් ලීක් වෙනවා | 폭발하다<br>පුපුරනවා | 불이 나다<br>ගිණි ගන්නවා |



ඔබ ඉහත ඉගෙනගත් වචන සිහි කරමින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 그림을 보고 맞는 말을 연결하세요. පින්තූරය බලා ගැලපෙන වචනය හා යා කරන්න.

①  ②  ③  ④  ⑤ 

㉠ 폭발하다 ㉡ 추락하다 ㉢ 부딪히다 ㉣ 미끄러지다 ㉤ 넘어지다

정답 ① ㉡ ② ㉠ ③ ㉢ ④ ㉤ ⑤ ㉣

## 문법 2 සංවාදය 2 –기 때문에

G49-2

ක්‍රියා පදයකට හෝ විශේෂණ පදයකට සම්බන්ධ වී යම් කාර්යයක් සිදුවීමට බලපෑ හේතුව සහ කාරණාව පැහැදිලි කරයි. නාම පදයක් යෙදෙන විට නාම පදය 'N 때문에' යොදාගනී.

- 작업을 할 때는 **감전될 수 있기 때문에** 안전장갑을 껴야 합니다.
  වැඩ කරන විට විදුලිසැර වදින්න පුළුවන් නිසා ආරක්ෂාකාරී අත්වැසුම් පැළඳිය යුතුයි.
- 바닥이 미끄러워서 쉽게 **넘어질 수 있기 때문에** 항상 주의해야 합니다.
  පොළොව ලිස්සන සුළු නිසා ලෙහෙසියෙන් වැටෙන්න පුළුවන් නිසා නිතරම ප්‍රවේශම් විය යුතුයි.
- 어제는 **피곤했기 때문에** 집에서 쉬었어요. ඊයේ මහන්සි වුන නිසා ගෙදර ඉඳගෙන විවේක ගත්තා.


'නාම පදය+이기 때문에' 'විශේෂණ පදය/ක්‍රියා පදය + 때문에' හේතු ප්‍රකාශ කිරීමේදී '–아서/어서' ව්‍යාකරණයට වඩා මෙම ව්‍යාකරණය තරමක් බැරෑරුම් හෝ සෘණාත්මක ප්‍රකාශන කිරීමේදී භාවිතා කරයි. අතීත කාලයෙන් ප්‍රකාශ කිරීමේදී '–았/었기 때문에' යොදනු ඇත.

### 비교해 보세요 සංසන්දනය කර බලන්න

**✔ '–기 때문에' සහ '–아서/어서'**

'–기 때문에' සහ '–아서/어서' යන දෙකම කිසියම් දෙයක හේතුව පිලිබිඹු කිරීමේදී භාවිතා වේ, පවසන පුද්ගලයාගේ හැඟීම් සහ තත්වය පිළිබඳ හේතුවක් අර්ථ දක්වන අවස්ථාවේදී බොහෝ විට '–아서/어서' භාවිතා කරයි. එමෙන්ම '–기 때문에' යන්න අතීත කාල '–았/었–' සමග සම්බන්ධ කල හැකි නමුත්, '–아서/어서' යන්න සම්බන්ධ කල නොහැක.

- 오랜만에 친구를 만나기 때문에 기뻐요. (X)
  오랜만에 친구를 **만나서** 기뻐요. (O)
- 고향에서 부모님이 **오셨기 때문에** 오늘은 못 만나요. (O)
  고향에서 부모님이 오셨어서 오늘은 못 만나요. (X)



'–기 때문에' ව්‍යාකරණය ගැන අවබෝධ වුණා නේද? එසේනම් උදාහරණය පරිදි සංවාදය සම්පූර්ණ කරන්න.

2. '–기 때문에'를 사용해서 대화를 완성하세요. '–기 때문에' භාවිතා කරමින් සංවාදය සම්පූර්ණ කරන්න.

1) 가: 높은 곳에서 작업할 때는 떨어지는 사고가 날 수 있습니다.
   ඉහළ ස්ථාන වල වැඩ කරන විට වැටීමේ අනතුරු වෙන්න පුළුවන.
   나: ______________ 괜찮을 겁니다. [안전대를 맸다 ආරක්ෂිත පටි පළඳින්න ]

2) 가: 지금 안에서 작업할 수 없어요? දැන් ඇතුලේ වැඩ නැද්ද?
   나: ______________ 지금은 들어갈 수 없어요. [바닥이 미끄럽다 බිම ලිස්සනවා]

3) 가: 밀링 작업을 할 때는 ______________ 보안경을 꼭 써야 해요. [파편이 튀다 කැබලි විසිවෙනවා]
   කපන වැඩ කරන විට (කැබලි කිරීම නිසා) ආරක්ෂිත ඇස් කණ්ණාඩි පැළඳිය යුතුය.
   나: 네, 알겠습니다. ඔව්, තේරෙනවා.


정답 1) 안전대를 맸기 때문에 2) 바닥이 미끄럽기 때문에 3) 파편이 튀기 때문에

## 활동 ක්‍රියාකාරකම්

**위험한 상황에 대해 말할 수 있어요? 〈보기〉처럼 이야기해 보세요.**
අනතුරුදායක අවස්ථාවන් ගැන කියන්න පුළුවන්ද? උදාහරණය පරිදි කතාකර බලන්න.


보기 උදාහරණ







바닥이 미끄럽다, 넘어지다
බිම ලිස්සනවා වැටෙනවා

1)






높은 곳에서 작업을 하다, 추락하다
උස් ස්ථානයක වැඩ කරනවා,
ඇදවැටෙනවා

2)






파편이 튀다, 화상을 입다
කැබලි විසිවෙනවා, පිළිස්සෙනවා


3)






안전장갑을 끼지 않다, 감전되다
ආරක්ෂිත අත් මේස් දාන්නේ නැහැ, විදුලි
සැර වැදෙනවා

4)





안전화를 신지 않다, 발을 다치다
ආරක්ෂිත පාවහන් පළඳින්නේ නැහැ,
කකුල තුවාල වෙනවා

정답 1) 높은 곳에서 작업을 하면 추락할 수 있어요. 조심하세요. 2) 파편이 튀면 화상을 입을 수 있어요. 조심하세요.
3) 안전장갑을 끼지 않으면 감전될 수 있어요. 조심하세요. 4) 안전화를 신지 않으면 발을 다칠 수 있어요. 조심하세요.

## 정보 තොරතුරු

# 신체 기관과 보호구

ශරීර අංග හා ආරක්ෂිත උපකරණ

### ✚신체와 위험요소 ශරීරය හා අනතුරුදායක කොටස



눈 ඇස
날아오는 물체, 빛
විසිවී එන ද්‍රව්‍ය/ආලෝකය

호흡기 ස්වසන පද්ධතිය
분진, 화학물질
දූවිලි/විෂ රසායන

손 අත
화학물질, 뜨거운 물체, 진동
විෂ රසායන/උණුසුම් ද්‍රව්‍ය/මැණික් කටුවේ වේදනාව

전신 මුලු ශරීරය
화학물질, 뜨거운 물질, 방사선, 분진
විෂ රසායන/උණුසුම් ද්‍රව්‍ය/කිරණයෙන් හා දූවිලි

머리 හිස
떨어지거나 날아오는 물체,
높은 곳에서 떨어짐
විසිවී එන ද්‍රව්‍ය/ඉහළ ස්ථානයකින් වැටීම

귀 කණ
소음 ශබ්දය

안면 මුහුණ
날아오는 물체, 화학물질
විසිවී එන කොටස්/රසායන ද්‍රව්‍ය

발 කකුල
떨어지는 물체(중량물), 화학물질,
뜨거운 물질, 날카로운 물체
ගැටෙන ද්‍රව්‍ය/රසායන/උණුසුම් ද්‍රව්‍ය/තියුණු ද්‍රව්‍ය

### ✚보호구의 종류 ආරක්ෂිත උපකරණ වර්ග

산업안전보건법에서 정하고 있는 보호구는 다음과 같습니다. වෘත්තීය ආරක්ෂණය හා සෞඛ්‍ය තත්ත්ව පාලන අධිකාරියේ නිර්දේශිත ආරක්ෂිත උපකරණ පහත දැක්වේ.



보안경 ආරක්ෂිත ඇස් ආවරණය
차광보안경, 일반보안경
ආරක්ෂිත කණ්නාඩි/ආරක්ෂිත වීදුරු

청력보호구 ආරක්ෂිත කන් ආවරණය
귀마개, 귀덮개
ආරක්ෂිත කන් ඇබය/ආරක්ෂිත කන් ආවරණය

보안면 ආරක්ෂිත මුහුණු ආවරණය
용접용 보안면, 일반 보안면
වෙල්ඩින් මුහුණු ආවරණය/ආරක්ෂිත මුහුණු ආවරණය

안전 장갑 ආරක්ෂිත අත් මේස්
절연장갑, 화학물질용 안전장갑
රබර් අත් මේස්/ රසායනික ක්‍රියාවලට එරෙහිව ඇති අත් මේස්

안전대 ආරක්ෂිත පටි
벨트식, 안전그네식
බෙල්ට්/ ආරක්ෂිත ශරීරාවරණ පටි

보호복 ආරක්ෂිත ඇඳුම්
방열복, 화학물질용 보호복
තාපය පිට කරන ඇඳුම්/ කෘෂි රසායන වලට ප්‍රතික්‍රියා කරන ඇඳුම්

안전모 ආරක්ෂිත හිස් වැසුම්
가죽A종, AB종, ABE종 ආදී වර්ගී

방진마스크 දූවිලි මුහුණු ආවරණය
전면형, 반면형(안면부 여과식)
සම්පූර්ණ මුහුණ ආවරණය/ අඩක් මුහුණ ආවරණය

방독마스크 ගෑස් ආවරණය
전면형, 반면형 සම්පූර්ණ මුහුණ ආවරණය/ අඩක් මුහුණ ආවරණය

송기마스크 වාතාශ්‍රය සපයන මුහුණු ආවරණ
호스마스크, 에어라인마스크,
복합식 에어라인마스크
නළය සහිත මුහුණු ආවරණය/ එයර් ලයින් මුහුණු ආවරණය/ වාතාශ්‍ර නල සහිත එයර් ලයින් මුහුණු ආවරණය

전동식 호흡보호구 වාතය පිරිසිදු කර ලබාදෙන ආරක්ෂිත උපකරණ
전동식 방진마스크, 전동식 방독마스크,
전동식 후드 및 전동식 보안면
දූවිලි ස්වසන කාරක ආවරණ/ ස්වං පූර්ණ හුස්ම ගැනීමේ උපකරණ


안전화 ආරක්ෂිත සපත්තු
가죽제 안전화, 고무제 안전화, 정전기 안전화,
발등안전화, 절연화, 절연장화
ආරක්ෂිත ලෙදර් සපත්තු/ රබර් සපත්තු/ දූවිලි සන්නායක සපත්තු/ වානේ ආරක්ෂිත සපත්තු/ විදුලි උවදුරු වලින් වැලකීමේ සපත්තු/ ආරක්ෂිත සපත්තු


## EPS-TOPIK 듣기 ශ්‍රවණය EPS-TOPIK

අංක 1 අංක 2 ප්‍රශ්නවලට සවන්දී ගැලපෙන පිළිතුර තෝරන ප්‍රශ්න වේ. ප්‍රශ්නයට සවන්දීමට පෙර කිනම් පින්තූර ඇත්දැයි බලමු.

[1~2] 잘 듣고 내용과 관계있는 그림을 고르십시오.
හොඳින් සවන් දී විස්තරය හා සම්බන්ධයක් ඇති පින්තූරය තෝරන්න.

Track 153

1. ①  ②  ③  ④ 

2. ①  ②  ③  ④ 

අංක 3 සහ අංක 4න් දැක්වෙන්නේ නිවැරදි පිළිතුර තෝරන ප්‍රශ්නයි. අංක 5 සංවාදයට සවන් දී නිවැරදි පිළිතුරු තෝරන ප්‍රශ්නයකි. ප්‍රශ්නය ඇසීමට පෙර පිළිතුර එක් වරක් කියවා බලන්න.

[3~4] 질문을 듣고 알맞은 대답을 고르십시오.
ප්‍රශ්නයට සවන් දී වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

3. ① 벌써 확인했습니다. ② 얼른 쓰고 오겠습니다.
③ 빨리 갈아 신으십시오. ④ 이쪽으로 들어가면 됩니다.

4. ① 얼른 가서 찾아보세요. ② 장갑을 새로 샀어요.
③ 깜빡했어요. 지금 낄게요. ④ 병원에 가야 될 거 같아요.

5. 이야기를 듣고 질문에 알맞은 대답을 고르십시오.
සංවාදය අසා ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුරු තෝරන්න.

남자가 해야 할 일이 아닌 것은 무엇입니까? පිරිමියා කළ යුතු වැඩක් නොවන දෙය කුමක්ද?

① 청소하기 ② 귀마개 하기
③ 마스크 쓰기 ④ 플러그 빼기



## 듣기 대본 ශ්‍රවණ පිටපත

1. 여: 떨어져서 다쳤어요. වැටිලා තුවාල වුණා.
2. 여: 보안경을 썼어요. ආරක්ෂිත කණ්නාඩි පැළඳුවා.
3. 여: 잠깐만요. 여기는 안전모가 없으면 들어갈 수 없습니다.
   පොඩ්ඩක්. ඉන්න මෙතන ආරක්ෂිත හිස් වැසුමක් නොමැතිව ඇතුළත් විය නොහැකියි.
4. 남: 어! 안전장갑을 안 꼈네요. 안전장갑을 안 끼면 손을 다칠 수 있어요.
   ආ. ආරක්ෂිත අත් මේස් පැළඳුවේ නැද්ද? පැළඳුවේ නැත්නම් අත තුවාල වෙන්න පුළුවන්.
5. 여 왜 귀마개를 안 하셨어요? 시끄럽지 않아요?
   ඇයි ආරක්ෂිත කන් ආවරණය පැළඳුවේ නැත්තේ? ශබ්දය වැඩි නැද්ද?

   남: 시끄럽지만 귀마개를 하면 불편해서요.
   ශබ්දය වැඩි වුනත් ආරක්ෂිත කන් ආවරණය පැළඳුවාම අපහසුයි.

   여: 그래도 여긴 소음이 심하기 때문에 귀마개를 꼭 해야 돼요. 그리고 작업장에는 먼지가 많으니까 마스크도 쓰는 게 좋아요.
   ඒ වුණත් මෙතන ශබ්ද වැඩි නිසා ආරක්ෂිත කන් ආවරණය අනිවාර්යයෙන්ම පළඳින්න. ඒ වගේම වැඩබිමේදී දූවිල්ල වැඩි නිසා මුහුණු ආවරණය පලඳින එකත් හොඳයි.

   남: 네, 그럴게요. හා, එහෙම කරන්නම්.

   여: 아! 작업이 끝난 후에는 기계의 플러그도 빼서 정리해 놓으세요.
   ආ..වැඩ ඉවර වෙලා යන්ත්‍රයේ කොටස් ගලවා පිළිවෙලක් කරන්න.

정답 1. ① 2. ② 3. ② 4. ③ 5. ①

## 확장 연습 තවදුරටත් වන අභ්‍යාස

L-49

1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
   සංවාදයට හොඳින් සවන්දී ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුරු තෝරන්න.

   남자가 작업장에 가는 이유는 무엇입니까? පිරිමි පුද්ගලයා වැඩ බිමට යන හේතුව කුමක්ද?


   ① 안전모가 없어져서　② 안전대가 필요해서
   ③ 안전복을 챙겨야 해서　④ 안전화를 신어야 해서

## 확장 연습 듣기 대본 තවදුරටත් වන අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 여: 아딧 씨, 안전복 모두 챙겨 입었죠? අදිත් මහත්මයා, ආරක්ෂක උපකරණ ඔක්කොම පැළඳගත්තා නේද?
   남: 네, 오늘은 높은 곳에서 작업한다고 해서 안전대도 착용했어요. 안전모도 챙겼고요.
   ඔව්, අද උස් තැනක වැඩ කරන නිසා ආරක්ෂිත පටිය පැළඳගත්තා. ආරක්ෂක උපකරණ ඔක්කොම පැළඳගත්තා.
   여: 좋아요. 어! 그런데 안전화는 왜 안 신었어요?
   හොඳයි, ඒ වුණත් ආරක්ෂිත සපත්තු ඇයි පැළඳුවේ නැත්තේ?
   남: 아, 깜빡했어요. 작업장에 가서 안전화로 갈아 신고 올게요.
   ආනේ අමතක උනා වැඩපොලට ගිහින් ආරක්ෂිත සපත්තු මාරුකර පළඳින්න.

정답 1. ④

# EPS-TOPIK 읽기 කියවීම



අංක 1 සහ අංක 2 පින්තූර බලා ගැලපෙන වාක්‍ය හෝ වචනය තෝරන ප්‍රශ්න වේ. ඉගෙන ගත් දේ මතක් කරමින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


[1~2] 다음 그림을 보고 맞는 단어나 문장을 고르십시오.
පහත පින්තූර බලා ගැළපෙන වචනය හෝ වාක්‍යය තෝරන්න.

1. 

① 마스크 ② 보호복
③ 안전모 ④ 용접면

2. 

① 감전될 수 있습니다. ② 넘어질 수 있습니다.
③ 부딪힐 수 있습니다. ④ 추락할 수 있습니다.



අංක 3 සහ අංක 4 නිවැරදි වචනය තෝරන ප්‍රශ්න වේ. අංක 5 ආරක්ෂිත ක්‍රම පිළිබඳ නිවේදනය කියවා පිළිතුරු සොයන ප්‍රශ්නයකි.

[3~4] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

3. 소음이 심한 곳에서 작업을 할 때는 ___________을/를 껴야 합니다.
ශබ්දය අධික ස්ථානයක වැඩ කරන විට (ආරක්ෂිත කන් ආවරණය) පැළඳිය යුතුයි.

① 귀마개 ② 목장갑 ③ 보안경 ④ 안전장화

4. 높은 곳에서 작업을 할 때는 아래로 떨어질 위험이 있습니다. 그러므로 반드시 ___________ 을/를 매고 일을 해야 합니다.
ඉහළ ස්ථානවල වැඩ කරන විට වැටීමේ අවදානමක් තිබේ. එමනිසා අනිවාර්යයෙන්ම ආරක්ෂිත පටිය පළඳා වැඩ කල යුතුයි.


① 보안면 ② 안전대 ③ 안전화 ④ 안전장갑

5. 다음 질문에 답하십시오. පහත ගැටලුවට පිළිතුරු සපයන්න.

〈선반 작업 주의 사항〉 ලියවන් පට්ටල් වැඩ
1. 옷이나 머리카락이 기계에 감기지 않도록 작업복을 입고 모자를 쓰십시오.
2. 파편이 눈에 들어갈 수 있기 때문에 보안경도 반드시 착용해야 합니다.
3. 장갑이 기계에 감겨서 사고가 날 수 있으니까 맨손으로 작업하십시오.

ඇඳුම් වල හෝ කොණ්ඩයේ යන්ත්‍ර සූත්‍ර ගැටෙන්නේ නැති වන්න ආරක්ෂිත ඇඳුම් ඇඳලා හිස් වැසුම් පළඳින්න.
කැබලි ඇසට යන්න පුළුවන් නිසා ආරක්ෂිත කණ්නාඩි අනිවාර්යයෙන්ම පැළඳිය යුතුයි.
අත් මේස් යන්ත්‍ර සූත්‍ර වල දැවටී අනතුරු වෙන්න පුළුවන් නිසා හිස් අතින් වැඩ කරන්න.

위 글과 관계가 없는 그림을 고르십시오. ඉහත ඡේදය හා සම්බන්ධයක් නැති පින්තූරය තෝරන්න.

① 
② 
③ 
④ 



정답 1. ④ 2. ① 3. ① 4. ② 5. ③



## 확장 연습 තවදුරටත් වන අභ්‍යාස

[1~3] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරන්න.

1. 작업을 할 때는 ________ 조심해야 합니다. 조심하지 않으면 언제 사고가 날지 모르기 때문입니다.

   ඔබ වැඩ කරන (සෑම විටම) ප්‍රවේශම් විය යුතුයි. ඔබ පරෙස්සම් නොවේ නම්, කුමන අවස්ථාවක හෝ ඔබට අනතුරක් සිදුවිය හැකි බැවිනි.

   ① 일찍 ② 다시
   ③ 항상 ④ 직접

2. 전기 작업을 할 때에는 안전장갑을 꼭 챙겨야 합니다. 안전장갑을 ________ 감전될 수 있습니다.

   විදුලියෙන් වැඩ කරන විට, ආරක්ෂක අත්වැසුම් අනිවාර්යෙන් පැළඳිය යුතුමයි. ආරක්ෂිත අත් මේස් (පැළඳුවේ නැත්නම්) විදුලි සැර වදින්නට පුළුවන්.

   ① 끼지 않으면 ② 신지 않으면
   ③ 끼기 때문에 ④ 신기 때문에

3. 밀링 작업을 할 때는 파편이 눈에 들어갈 수 있습니다. 그러므로 보안경을 반드시 ________.

   කපන වැඩ වලදී කැබලි ඇසේ යන්න පුළුවන්, එම නිසා ආරක්ෂිත ඇස් ආවරණය අනිවාර්යෙන් (පැළඳිය යුතුමය).

   ① 써야 됩니다 ② 입어야 됩니다
   ③ 쓴 적이 있습니다 ④ 입은 적이 있습니다

정답 1. ③ 2. ① 3. ①

## 발음 උච්චාරණය P-25

**හොඳින් සවන් දී පුනරුච්චාරණය කරන්න.**

ව්‍යඤ්ජන ‘ㅂ’, ‘ㄷ’, ‘ㄱ’, ‘ㅈ’ ඉදිරියෙන් හෝ පිටුපසින් ‘ㅎ’ පැමිණෙන විට, එකින් එක මහප්‍රාණ [ㅍ], [ㅌ], [ㅋ], [ㅊ] ලෙස උච්චාරණය කරයි.

(1) 좋다, 넣고, 쌓지
(2) 축하, 입학, 백화점
(3) 생일 축하합니다.
(4) 한국어 수업은 9시에 시작해요.